ගොවිතැනට අත දෙන මිනිස්සු

# පන්ති කාමරයෙන් එළවළු වගාවට

නුවරඑළියේ හාවාඑලිය, සෞම්‍ය කලාපයේ එළවළු වගාවට තෝතැන්න ලෙස සැළකිය හැකියි. වර්ෂයේ ඕනෑම කාලයක හාවාඑලියට යන කෙනෙකුට ගෝවා, ලීක්ස්, බීට්රූට්, කැරට් වැනි එළවළුවක් හෝ අර්තාපල් වැනි වගාවක් දැකීම සුලභ දර්ශනයකි. වෙනත් බොහෝ ප්‍රදේශවල නොතකා හරින හරම් ඉතා සුළු ඉඩකඩකින් විශාල ආදායමක් ලැබීමට උඩරට ගොවියා පුරුදු වී සිටී.

හාවාඑලියේ උපන් එක් පාසැල් ශිෂ්‍යයෙක් සිය විවේක කාලයේදී කෘෂිකර්මය කෙරෙහි උනන්දුවිය. එහෙත් බොහෝ දෙනා කරන්නාක් මෙන් තනිවම නොවේ. සිය යහළුවන්ද හවුල් කරගෙනය.

මෙම පාසැල් සිසුවා කේ. ආර්. නිහාල් ය. සිය පන්තියේ සිටි තවත් මිතුරන් තිදෙනෙකුද සමඟ හේ එළවළු පාත්තියක වගා කටයුතු ආරම්භ කිරීම ගැන කල්පනා කළේය. එහෙත් ආරම්භයේදීම ඔවුන්ට ප්‍රශ්න ඇති විය. පළමුවැන්න ඉඩමක්. ඉඩම් ප්‍රශ්නය ඉතා තදින් බලපාන නුවරඑළියේ, මෙම වගා කටයුත්ත සඳහා ඉඩමක් ලබා ගැනීම පහසු කටයුත්තක් නොවේ. තම අත්දැකීම් විස්තර කරන නිහාල් : ''අපි දන්න හැම තැනකින්ම සෙව්වා ඉඩම් කෑල්ලක් ඉල්ලා ගන්න. නමුත් බැරි වුනා. අපි ඊට පස්සෙ කුඩා ඇළකින් වටවුන මඩගොහොරුවක් අසල් වැසියන්ගෙන් ඉල්ලා ගත්තා. ඒත් ඒ ඉඩම් කැබැල්ල වගා කිරීමට සුදුසු එකක් නොවෙයි. ඒනිසා අපි ඈත ප්‍රදේශවලින් පොහොර පස් ගෙනැවිත් ගොඩකර වගාවකට සුදුසු ලෙස ඉඩම සකස් කර ගත්තා.''

එහෙත් එයින් ඔවුන්ගේ ප්‍රශ්න නැවතුනේ නැත. වගාවට අවශ්‍ය අනෙක් ද්‍රව්‍ය—රෝපණද්‍රව්‍ය—කෘෂි රසායනික ද්‍රව්‍ය ආදිය ලබා ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා ඔවුන්ට වෙනත් සුළු සුළු රැකියාවල නියැලී මුදල් උපයා ගැනීමට සිදුවිය.



නිහාල්ගේ කණ්ඩායම ගෝවා අස්වැන්න නෙලද්දී

මේ මුදල් යොදා ඔවුන්, පළමුවන වගාව—බීට් ආරම්භ කළහ. එහෙත් එය ඔවුන් සිතූ පරිදි පහසු කාර්යයක් නොවී ය. නිහාල් කියන්නේ—''අපි ඇට සිටුවා ටික කලක් යනවිට හිතුවා මේ වගාව සාර්ථක වෙන එකක් නෑ කියලා. ඒ මොකද ? වගා කාලය කෙටි වුනාට ඒ කාලය තුළ ඉතා පරිස්සමින් වගාකටයුතු කරන්න ඕනෑ. සෑමදම වතුර සැපයීම, තෙල් ඉසීම, නියම වෙලාවට පොහොර දැමීම වැනි දේවල් අකුරටම කරන්නට ඕනෑ. ඒ නිසා අපි අසල් වැසි ගොවියන්ගෙන් උපදෙස් අරගෙන වගා කටයුතු කළා.''

එම ප්‍රයත්නය පලරහිත එකක් නොවී ය. ඔවුන්ගේ අස්වැන්නඉන්පසු වගා කටයුතුවලට අවශ්‍ය සම්පත් ගෙන දුන්නේය. පෙර වගාකළ ඉඩම සඳහා කුලියක් ගෙවීමටත්, තවත් එවැනිම කුඩා ඉඩමක් කුලියට ගෙන වගා කිරීමටත් එයින් ඉඩකඩ ලැබිණ. මෙලෙස වගාකටයුතු කිරීමේදී මෙම කණ්ඩායමේ අනාගතය තීරණය කෙරෙන වැදගත් ප්‍රශ්නයක් මතුවිය.

ඒ ජීවන වෘත්තියට කුමක් තෝරා ගන්නේද යන්නයි. යම් කිසිවෙකු යම් කෙනෙකු යටතේ රැකියාවක නියැලුනහොත් ලැබෙන ආදායමේ සීමිත බව ඔවුන්ට දක්නට ලැබිණ. ඒ සිනිසා තම හුරු පුරුදු එළවළු ගොවිතැනම ජීවන වෘත්තිය ලෙස තෝරා ගැනීමට ඔවුන් තීරණය කළහ.

ඒ තේරීම කොතරම් නිවැරදි දැයි සිය අත්දැකීම් දෙස ආපසු හැරීබලන ඔවුන්ට පෙනේ. ''අපේ අනිත් යාලුවො වෙන පලාත්වලට ගොස් රක්ෂාවල් කර වර්ෂයකින් උපයන මුදල අපට එක් එළවළු වාරයකින් ලබාගන්න පුළුවන්. එද අනුන්ගේ ඉඩමේ වගා කළ අපිට දූන් එක්කෙනාට අක්කර භාගය බැගින් තියෙනවා. අපිට දූන් කිසි බයක් නෑ.''

එහෙත් ඔවුන්ගේ ජීවිතය ප්‍රශ්න වලින් බැහැර එකක් නොවේ. ''අපට ඇති ප්‍රධානම ප්‍රශ්නය එළවළු ඇට මිළදී ගැනීමට ඇති බාධාවයි. ඒවුනත් ආණ්ඩුවේ අලුත් තීරණය නිසා එළවළු ඇට ලබා ගැනීම පහසු වෙයි කියලා හිතෙනවා. අනිත් ප්‍රශ්නය තමා එළවළු වාර යේදී මිල බැසීම. මෙයට අප කරන්නේ අනික් ගොවියන් වවන එළවළු නොවැවීමයි. තවත් ප්‍රශ්න යක් තමා කෘමිනාශක වැනි දේ කලට වේලාවට නො ලැබීම. ඒ නිසා අපට අවශ්‍ය කෘමි නාශක ලබාගැනීමට පිට පලාත් වලට යන්න සිදුවෙනවා. තවත් ප්‍රශ්න යක් තමා සමහර එළවළු වල රෝපන ද්‍රව්‍ය වලින් නිසි අස් වැන්න නොලැබීම. උදහරණයක් වශයෙන් අපි මේ සැරේ වගා කළ රාබුවලින් මල්සිපුනා මිස අල ලැබුනේ නැහැ.''



සරුසාර ගෝවා අස්වැන්නක්.

මේ ප්‍රශ්න සදකාලික ඒවායැයි ඔව්හු නොසිතති. ඒ එම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඔවුන්ගේ අත් දැකීම් හා තාරුණ්‍යය ආධාර වන හෙයිනි. එය ටත් වඩා සිය මිත්‍රත්වයේ ඇති සාමුහික බලය ඔවුන්ට ප්‍රශ්න වනසන අසිපතක් වැන්න.